# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

දෙවන වාර පරීක්ෂණය - 2016
12 ශ්‍රේණිය
නර්තනය - I

කාලය පැය 1

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
**ප්‍රශ්න අංක 1.1 සිට 1.5 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හිස්තැන් වල ලියන්න.**

1.1 නර්තනය අනිවාර්යය විෂයයක් වශයෙන් ............................................ වර්ෂයේදී පාසල් විෂය මාලාවට ඇතුළත් කරන ලදී.

1.2 අභිනය යන සංකල්පය තුළ .................................................. සම්ප්‍රදාය අනෙකුත් දේශීය නර්තන සම්ප්‍රදායන්ට වඩා යුක්තය.

1.3 සබරගමු නර්තන සම්ප්‍රදායේ මුල්ම චලන අභ්‍යාසය ................................. වශයෙන් හඳුන්වයි.

1.4 වේදිකාව සඳහා නර්තනය සැලසුම් කිරීම ................................... ලෙස සැලකිය හැකිය.

1.5 තේවා වාදනය සඳහා ............................................... ප්‍රධාන සුසිර භාණ්ඩය වශයෙන් භාවිත කරයි.

**ප්‍රශ්න අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හිස්තැන් වල ලියන්න.**

1.6 දේශීය නර්තනය හා බැඳි ශාන්ති කර්ම අතුරින් සේරිමාණි රජු ගැන කියවෙන ශාන්ති කර්ම 2 ක් නම් කරන්න.
1. .............................................. 2. ..........................................

1.7 ලී කෙළි හා කල නැටුම් වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් දෙක නම් කරන්න
1. .............................................. 2. ..........................................

1.8 උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදායන් දෙකට අයත් වට්ටම් දෙකක් නම් කරන්න
1. .............................................. 2. ..........................................

1.9 උඩරට සහ සබරගමු වන්නම් අතරින් නාමික වශයෙන් සමානතා දක්වන වන්නම් දෙකක නම් ලියන්න.
1. .............................................. 2. ..........................................

1.10 ශ්‍රී ලංකාවේ වාද්‍ය භාණ්ඩ පිළිබඳව ඓතිහාසික සාධක ලබාගත හැකි දඹදෙණි යුගයට අයත් ග්‍රන්ථ දෙක නම් කරන්න.
1. .............................................. 2. ..........................................

**ප්‍රශ්න අංක 1.11 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැලපෙන හෝ පිළිතුරු තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

1.11 ගැට බෙරය, පහතරට බෙරය, දවුල සඳහා සුවිශේෂී වූ කොටස් හඳුන්වන නම් තුන අනුපිළිවෙලින් දක්නට ඇත්තේ කුමන පිළිතුරේද ?
1) බෙර පුහුල, කන්වරය, හයි තට්ටුව
2) කැපුම් හට, ඉල්ලම, ගැටිය
3) සුරත් තට්ටුව, වෙනිවර, කඩිප්පුව
4) කයිපුඩි වලල්ල, තට්ටුව දකුණු ඇස
5) බෙර පුහුල, හයි තට්ටුව, කඩිප්පුව

1.12 තාලය යන්න හැඳින්වීම සඳහා වඩාත් ගැලපෙන ප්‍රකාශය මින් කුමක්ද ?

1) තිත්, තෙයි දැක්වීම 2) ව්‍යුහගත රිද්මයයි. 3) තැලීමේ ක්‍රියාවලියයි.

4) තාලය බෙදා දැක්වීමයි. 5) පාලනය කල රිද්මයයි.

1.13 වාසනා දිනේදී මේක පාමු තුටින් නටන මෙම ගීතයට අනුව නර්තන නිර්මාණය පහසුවෙන් කලහැක්කේ,

1) තාලානුකූල හා රිද්මයානුකූල චලන 4) රිද්මයානුකූල සංචලන වේ

2) තලානුකූල හා ප්‍රකාශනාත්මක චලන 5) ප්‍රකාශනාත්මක හා සංචාරී චලන වේ

3) ප්‍රකාශනාත්මක හා රිද්මයානුකූල චලන

1.14 සිරි වසගෙන අසු නැගෙමින් තෙලසා
සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙ සා
මෙම කවිය

1) සෙත්කවි වල විරු වෙනුවෙන් ගයයි

2) බලි ශාන්ති කර්මවල හිරු වෙනුවෙන් ගයයි.

3) කෝලම්, කවි නාඩගම්, නූර්ති, රූකඩ

4) පිරියකා වෙනුවෙන් වූ ඉර මුදුන් සමයමේ එන කවියකි

5) අසු ගැබේ මල්බලියේ හිරු සහ දෙවියන වෙනුවෙන් ගයයි.

1.15 සිංහල ගැමි නාටක මේවා වශයෙන් සඳහන් කළ හැක.

1) කෝලම්, රූකඩ, සොකරි , නූර්ති 4) නාඩගම්, පාස්කු, කෝලම්, කාටකම්

2) සොකරි, කෝලම්, රූකඩ, නාඩගම් 5) සොකරි, කෝලම්, රූකඩ, ලෙන්චිනා

3) කෝලම්, කවි, නාඩගම්, නූර්ති, රූකඩ

1.16 නර්තනයක හා බැඳි ගණිත ලක්ෂණ දැක්වෙන වචන සමූහය කුමක්ද ?

1) ප්‍රස්ථාර කරණය, තාලය, ලය, වාදනය 2) තාලය, ලය, ප්‍රස්තාරකරණය, සම්බන්ධතා

3) රිද්මය, තාලය, ප්‍රස්තාකරණය, වාදනය 4) තිත, තාලය, කාලය, ප්‍රස්තාකරණය

5) අවකාශ භාවිතය, ප්‍රස්තාකරණය, කාලය, නර්තනය

1.17 උඩරට, පහතරට, සබරගමු නර්තන කලාව පිළිබඳ ග්‍රන්ථකරණයට බව මුල්ම ලේඛකයන් තිදෙනෙකි.

1) එදිරිවීර සරත්චන්ද්‍ර, එස්.එල්.එච්.ප්‍රනාන්දු, කිරිඇලල්ලේ ඥාණවිමල හිමි

2) ඊ.ඒ.දෙල්ගොඩ, විල්සන් බලබොටුව, එස්.එල්.බී.කපුකොටුව

3) ජේ.ඊ.සේදරමන්, සචිරින් සිල්වා, ඊ.ඒ.දෙල්ගොඩ

4) පණිභාරත, කේ.එස්.ප්‍රනාන්දු, සිරිබෝ හාමි

5) ජේ.ඊ.සේදරමන්, ගෝමිස් ගුරු, එස්.එල්.බී.කපුකොටුව

1.18 මෙහි දැක්වෙන අනුපිළිවෙලින් ශෘගාර. වීර, අද්භූත බී.භත්සය රැසකට මූලික වන භාවයන් තෝරන්න.

1) රතිය, නිර්හිත, උත්සහය, පිළිකුල 4) කාම, වීර, පුදුම, පිළිකුල

2) ශෘංගාර, වීර, පුදම, භය 5) කාම, උත්සහය, ආශ්චර්ය, භයානක

3) කාම, උත්සහය, ආශ්චර්ය, භයානක

1.19 ආංගික අභිනයේදී අංග ප්‍රත්‍යාංග. උපාංග වශයෙන් තුනක් දැක්වේ. ඉන් අංග කොටසට මේවා අයත් වේ.

1) හිස, ගෙල, ඇස්, ඇහිබැම සහ නලල

2) හිස්, අත්, පපුව, ඉණ, පාද සහ දෙපාර්ශවය

3) අත් පා, කද, උකුල, දණහිස සහ වලලු කර

4) හිස, ඇස්, අත් පා සහ කඳ

5) අත්, පා, කඳ, කටිය, උකුල සහ පතුල

1.20 ප්‍රසාංගික කලා යන්නට අයත් වන්නේ,

1) නූතන, වේදිකාවේ දැක්වෙන නර්තන හා ගායන වේ

2) නර්තන, සංගීත, චිත්‍ර හා නාට්‍ය වේ

3) රූපවාහිනිය මගින් දැක්වෙන නර්තන අවස්ථා

4) නර්තන, ගායන, වාදන හා රංග අවස්ථාවේ

5) ජනමාධ්‍ය ඔස්සේ දැක්වෙන නර්තනය හා සංගීතය වේ.

# ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

**දෙවන වාර පරීක්ෂණය - 2016**
**12 ශ්‍රේණිය**
**නර්තනය - II**

*කාලය පැය 1*

- **පළමුවන කොටසින් ප්‍රශ්න දෙකක්ද,** II, III,IV **කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

- **සෑම ප්‍රශ්නයකටම** (i) **කොටසට ලකුණු 06 ක්ද** (ii) **ලකුණු 06 ක්ද** (iii) **ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමිවේ.**

## I

01. i. තාල සංකල්පය යටතේ මාත්‍රාව යන්න හඳුන්වන්න.
ii. මාත්‍රා තුනේ තනි තිතට අදාළව ග්‍රහපංති කවියක් හා අදාළ කස්තිරමක් ප්‍රස්ථාර කරන්න.
iii. මාත්‍රා 2+2+ 4 තුන් තිතට අඩව්වක් ප්‍රස්ථාර කරන්න.

02. ගැමි නැටුම් හා එම ගායන මගින් ගැමි ජනතාවගේ ජිවන රටාවේ ස්වභාවය මැනවින් පිළිබිඹු කරයි.
i. මෙම කියමන සනාථ කර ගැමි නැටුම් 2 ක් නම් කරන්න.
ii. ඒවාට අදාළ කවි වලින් කියැවෙන ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ කෙබඳුද ? විස්තර කරන්න.
iii. ගැමි නැටුම් 4 කට අදාළ කවි 4 ක් ලියා දක්වන්න.

03. ශාන්ති කර්ම ප්‍රධාන වශයෙන් ආගමික වත් පිළිවෙත් හා බැඳි පවතින්නේ සමාජයට යහපත් ආදර්ශයක් ලබාදීමේ අරමුණෙනි.
i. බෞද්ධාගමික වශයෙන් ශාන්ති කර්ම තුල වන ආගමික පසුබිම සැකෙවින් විස්තර කරන්න.
ii. කොහොඹා කංකාරි ශාන්ති කර්මය වූ කලි පවිත්‍රත්වයන් මඩුව සකසා බුදුන් ප්‍රමුඛ දෙවියන් ප්‍රධාන කොට පූජාර්ථයෙන් ඉටු කරන ක්‍රියාවලියකි. හත් පද පෙලපාලිය ඇසුරින් කරුණු දක්වන්න.
iii. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් 10 ක් ඇඳ නම් කරන්න.

## II

04. දේශිය නර්තන කලාවේ විකාශනයේදී එක් එක් යුගවලට විවිධ වූ කරුණු සොයාගත හැකිවේ.
i. මහනුවර යුගයේ වන්නම් බිහිවීම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
ii. ගම්පොළ යුගයේ නර්තන කලාව පැවති බවට සාධක ඇසුරින් කෙටි විස්තරයක් කරන්න.
iii. ක්‍රි.ව 1950- 1980 දක්වා දේශිය නර්තන කලාවේ ප්‍රවර්ධනයට බලපෑ කරුණු 4 ක් දක්වන්න.

05. i. ශ්‍රී ලාංකික ගැමි නාටක වර්ග 4 ක් නම් කරන්න.
ii. සොකරි නාටකයේ චරිත දෙකක් පිළිබඳ විග්‍රහ කරන්න.
iii. මුදලිකෝලම හා ජස කෝලම ගත් කල එම චරිතවලින් විවරණය වන සමාජය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## III

06. දීර්ඝ ඉතිහාසයක් ඇති භාරතීය නර්තන දැඩි ලෙස ආගමික පසුබිමක් මත ගොඩ නැගුනකි.

- i. භරත නර්තන සම්ප්‍රදායේ වර්ධනයට දායක වූ පුද්ගලයින් නම් කරන්න.
- ii. භරත නාට්‍යම් හි නර්තන අංග නම් කර ශබ්දම් යන අංගය කෙටියෙන් හඳුන්වන්න.
- iii. භරත නාට්‍යම් හි කාන්තා රංග වස්ත්‍රාභරණ පලඳින ස්ථාන අනුව නම් කරන්න.

07.

- i. දක්ෂිණ භාරතීය නර්තන සම්ප්‍රදා දෙක හා ඒවායෙහි සංගීත සම්ප්‍රදාය නම් කරන්න.
- ii. කේරලය පුරා ප්‍රචලිතව පැවැති නර්තන සම්ප්‍රදාය නිර්මාණය වූ ආකාරය පිළිබඳව ලියා දක්වන්න.
- iii. එම නර්තන සම්ප්‍රදාය තුල දැකිය හැකි වේශ නිරූපණ ක්‍රම 5 ක් නම් කරන්න.

## IV

08.

- i. ශ්‍රී ලාංකේය නර්තන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පින් දෙදෙනෙකු නම් කර එක් අයකු පිළිබඳ අගයන්න.
- ii. උඩරට, පහතරට හා සබරගමු වශයෙන් බිහිවූ නර්තන ශිල්පින් 3 දෙනෙකු නම් කරන්න.
- iii. වාණිජකරණය හමුවේ කාන්තා දායකත්වය ප්‍රබල වීම නර්තන ක්ෂේත්‍රයට බලපෑ අයුරු පහදන්න.

09.

- i. නර්තන කලාවේ ප්‍රභවය හා සම්බන්ධව පවතින යුග නම් කරන්න.
- ii. යුගවලට අනුව නර්තන කලාවේ මූලික අවධියේ ව්‍යාප්තිය පිළිබඳ කරුණු දක්වන්න.
- iii. පෙරදිග නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

The National e-learning Portal for The General Education